# පළාත් පාලන ආයතන වල පුස්තකාල සංවර්ධනය සඳහා වූ යෝජනා

1998 ඔක්තෝම්බර් 04

පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ
කොමිෂන් සභාව වෙත

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

ඉදිරිපත් කරනු ලබන

# පළාත් පාලන ආයතනවල පුස්තකාල සංවර්ධනය සඳහා වූ යෝජනා

1998 ඔක්තෝබර් 14

# පටුන

පිටු අංක

## පළමු කොටස - පසුබිම


පළාත් පාලන ආයතන හා පුස්තකාල සේවා 01

යුනෙස්කෝ මහජන පුස්තකාල පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනය 01

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය හා පළාත් පාලන පුස්තකාල සේවා 02

මහජන පුස්තකාල පිළිබඳ ජාතික සැලැස්ම 08

ශ්‍රී ලංකාවේ අනාගත මහජන පුස්තකාල සේවාව සැලසුම් කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු 10


## දෙවන කොටස - නිර්දේශ


ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ යෝජනා හා නිර්දේශ 14

සමාප්තිය 19

ඇමුණුම

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිසම වෙත පළාත් පාලන පුස්තකාල සේවාව පිළිබඳව ඉදිරිපත් කරනු ලබන නිර්දේශ

## පළමු කොටස - පසුබිම

### 1. පළාත් පාලන ආයතන හා පුස්තකාල සේවා

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන මට්ටමේ පුස්තකාල සේවාවන් පවත්වා ගෙනයාම සියලුම පළාත් පාලන ආයතන සතු එක් වගකීමක් වේ. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 1998 වසරේ වාර්තාවට අනුව 1996 වසර අවසන් වනවිට මහනගර සභා ආශ්‍රිත පුස්තකාල 74 ක්ද, නගර සභා ආශ්‍රිත පුස්තකාල 77 ක්ද, ප්‍රාදේශීය සභා ආශ්‍රිත පුස්තකාල 685 ක්ද ලෙස මහජන පුස්තකාල 836 ක් දිවයින පුරා විසිර පැවතුණි.

### 2. යුනෙස්කෝ මහජන පුස්තකාල පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනය

මහජන පුස්තකාල සේවාවන් පවත්වා ගෙනයාම පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් යුනෙස්කෝ (UNESCO) ආයතනය පසුගිය දශක 05 ක පමණ කාලය තුළ ඉතා විශාල උනන්දුවක් දක්වන ලදී. අන්තර් ජාතික පුස්තකාල සංගම් සහ ආයතන සම්මේලනයේ (IFLA) සහාය ඇතිව යුනෙස්කෝ ආයතනය **මහජන පුස්තකාල පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනය** වර්තමාන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සංශෝධනය කොට 1997 වසරේදී පළකර ඇත. ඒ මගින් මහජන පුස්තකාලයක කාර්ය භාරයත්, වගකීමත්, එය සංවිධානය කළයුතු ආකාරයත් පිළිබඳව පැහැදිලි කර ඇති අතර අද එය පළාත් පාලන පුස්තකාල සේවා සංවිධානය පිළිබඳ අන්තර් ජාතිකව පිළිගත් ප්‍රමිතිය වේ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කර ප්‍රසිද්ධ කරන ලද මහජන පුස්තකාල පිළිබඳ යුනෙස්කෝ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටපතක් මේ සමග අමුණා ඇත.

## 3. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය හා පළාත් පාලන පුස්තකාල සේවා

### 3.1 ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනත - 1970

1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනත මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවන ලදී. දිවයිනේ විවිධ වර්ගවල පුස්තකාල සේවාවන් සංවර්ධනය කරලීම පුස්තකාල සේවා මණ්ඩලයේ මූලික වගකීමක් වන අතර, අදාළ පනතේ 03 වන කොටසේ 14 වගන්තිය මගින් මහජන පුස්තකාල සම්බන්ධයෙන් පහත සඳහන් වගකීම් මණ්ඩලයට පවරාදී තිබුණි.

(අ) සාමාන්‍යයෙන් පුස්තකාල සේවා සංවිධානය කිරීම හා සංවර්ධනය කිරීම පිළිබඳ සැලසුම් කිරීම හා එහිලා සහාය වීම.

(ආ) මහජන පුස්තකාල සේවා දියුණු කිරීම් හා සංවර්ධනයේලා උපදෙස් දීම හා සහාය වීම.

(ඉ) පුස්තකාල සේවාවන්හි සේවයේ යොදවනු ලබන තැනැත්තන් සඳහා අවම ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම් නියම කිරීමෙහිලා රජයට උපදෙස් දීම හා සහාය වීම.

(ඊ) පුස්තකාල අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ සංවර්ධනය, දියුණු කිරීම

(උ) පුස්තකාල සේවා පිළිබඳ සාමාන්‍ය දියුණුව පිළිබඳ සාමාන්‍යයෙන් අවශ්‍ය විය හැකි යම් කාර්යයන් කරගෙන යාම.

මෙම පනත පසුගිය අවුරුදු 28 මුළුල්ලේම ක්‍රියාත්මකවූ අතර, ඒ මගින් පැවරී ඇති බලතල අනුව මෙහි ඉදිරි ඡේදයක දැක්වෙන පරිදි මහජන පුස්තකාල සේවාවන් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සැලකිය යුතු දායකත්වයක් ලබාදී ඇත.

### 3.2 ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත - 1998

මුල් පනතේ ඇති විවිධ සීමා සහ කාලීන අවශ්‍යතාවලට නොගැළපීමේ තත්ත්වයන් සලකා බලා ඒ වෙනුවට ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත නමින් නව පනතක් 1998.09.11 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කර ගන්නා ලදී.

මෙම නව පනත ගරු අමාත්‍යතුමා විසින් නිශ්චය කරනු ලබන ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක වන අතර, ඒ මගින් දිවයිනේ පුස්තකාල සේවාව සංවර්ධනය කරලීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයට යම් පමණක වගකීම් හිමිවී ඇත. නව පනතේ 04 වන වගන්තියේ මෙම ක්ෂේත්‍රයට අදාළ මණ්ඩලයේ කර්තව්‍ය වශයෙන් :

(අ) සියලුම ප්‍රජා අංශ අතර පුස්තකාල හා ප්‍රලේඛන සේවා සඳහා වූ අවශ්‍යතා ඇගයීම සහ පුස්තකාල හා ප්‍රලේඛන සේවා දියුණුව ප්‍රවර්ධනය කිරීම.

(ආ) ශ්‍රී ලංකාවේ පුස්තකාල හා ප්‍රලේඛන දියුණුව සඳහා වූ සැලසුම්, වැඩසටහන් හා කටයුතු පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් දීම.

(ඇ) ශ්‍රී ලංකාවේ පුස්තකාල හා ප්‍රලේඛන සේවා සම්බන්ධීකරණය කිරීම හා ඒ සම්බන්ධයෙන් සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු සැලැස්වීම.

(ඉ) ශ්‍රී ලංකාවේ පුස්තකාලවලට හා පුස්තකාලයාධිපතිවරුනට වෘත්තීය උපදෙස් හා පුහුණුව සැලසීම සහ ගෘහභාණ්ඩ, උපකරණ, පුස්තකාල හා ප්‍රලේඛණ ද්‍රව්‍ය සැපයීම ඇතුළුව කාර්මික හා ද්‍රව්‍යමය අධාර ලබාදීම.

(උ) පුස්තකාල හා ප්‍රලේඛන සේවාවන්හි සියලුම අංශවල ජාතික ප්‍රමිති සකස් කර ප්‍රකාශයට පත් කිරීම

ඇතුළු වගකීම් ගණනාවක් පැවරී තිබේ.

එසේම මෙම පනතේ දෙවන කොටස මගින් මණ්ඩලයේ කළමනාකරණය හා පාලනය යටතේ **ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය** පිහිටුවනු ලබන අතර එහි කර්තව්‍යයන් ලෙස පහත සඳහන් කටයුතු දක්වා ඇත.

(අ) සියලුම ජන කොටස්වල භාවිතය සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවලට උචිත පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික සංචිතයක් ලබාදීම.

(ඉ) ජාතික ග්‍රන්ථ විද්‍යා සේවා සහ ජාතික හා ජාත්‍යන්තර පුස්තකාල ද්‍රව්‍ය සුචියද ඇතුළුව ග්‍රන්ථ විද්‍යා සේවා සැපයීම.

(උ) ශ්‍රී ලංකාවේ සියලුම ජන කොටස්වලට තොරතුරු යොමු කිරීමේ සේවාද ප්‍රතිකෘති සහ ලේඛනමය පර්යේෂණ සේවා සැපයීම.

(ඒ) ශ්‍රී ලංකා ප්‍රජාවේ සියලුම ජන කොටස්වලට සේවය කරන මහජන, පාසැල්, ශාස්ත්‍රීය, ආණ්ඩුවේ සහ වෙනත් පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථාන ජාලයද ඇතුළුව පුස්තකාල හා ප්‍රලේඛන ජාල පිහිටුවීම, වැඩිදියුණු කිරීම හා පවත්වාගෙන යාම, ප්‍රවර්ධනය කිරීම ඒ සඳහා උපදෙස් දීම හා සහාය වීම.

(ඕ) ශ්‍රී ලංකාවේ පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානවලට නව තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම හා කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට. . . උපදෙස්, සහාය හා පුහුණුව ලබාදීම.

පළාත් පාලන ආයතන පුස්තකාල පිහිටුවීම, පවත්වා ගෙන යාම හා සංවර්ධනය කිරීම ඒ ඒ පළාත් පාලන ආයතනවල වගකීමක් හා කාර්ය භාරයක් වුවද, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මුල් පනත සහ මෙම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල නව පනත මගින් මෙම ජාතික මට්ටමේ ආයතනයට අදාළ කටයුතු සඳහා උපදෙස් දීම, මග පෙන්වීම, ආධාර දීම සහ සම්බන්ධීකරණය කරලීම සඳහා පුළුල් වගකීමක් පවරා ඇත.

## 4. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මහජන පුස්තකාල සේවා

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ප්‍රධාන අංශ දෙකකින් පළාත් පාලන ආයතන පුස්තකාල ක්ෂේත්‍රය සඳහා දැනට ආධාර කරනු ලැබේ. එම ආධාර

(අ) වෘත්තීය උපදෙස්

(ආ) ද්‍රව්‍යමය ආධාර

වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක.

### 4.1 වෘත්තීය උපදෙස්

වෘත්තීය උපදෙස් යටතේ පළාත් පාලන පුස්තකාල සේවාව සංවර්ධනය කිරීම සඳහා සැලසුම් පිළියෙල කිරීම, උපදෙස් දීම, මග පෙන්වීම්, ප්‍රමිති සැකසීම්, පුස්තකාල ශ්‍රේණිගත කිරීම් හා පුහුණු පාඨමාලා පැවැත්වීම ආදිය සිදු කෙරේ.

### 4.1.1 ජාතික මට්ටමේ සැලසුම්

මහජන පුස්තකාල සේවාව දියුණු කිරීම සහ පළාත් සභා ක්‍රමය යටතේ වඩාත් ඵලදායී සහ විද්‍යානුකූල මහජන පුස්තකාල සේවාවන් සංවර්ධනය කිරීම සඳහා පළාත් සභා පුස්තකාල සංවර්ධන සැලැස්මක් පිළිබඳ මූලික ව්‍යුහයක් මණ්ඩලය විසින් යෝජනා කරන ලදී. මෙම ව්‍යුහය ප්‍රතිපත්තියක් වශයෙන් පළාත් සභා ගණනාවක්ම පිළිගෙන ඇති අතර, එය ඇතුළත් පුස්තකාල ප්‍රඥප්ති සම්මත කර ගැනීම දැනට පළාත් සභා ගණනාවක සිදුකර ඇත. මේ පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීමක් ඉදිරි ඡේදයේ දැක්වේ.

### 4.1.2 මහජන පුස්තකාල ප්‍රමිති සම්පාදනය

ඕනෑම පුස්තකාල සේවාවක් සංවර්ධනය කිරීම සඳහා පිළිගත් ප්‍රමිතීන් අනුව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව මහජන පුස්තකාල ක්ෂේත්‍රයේ ඒ ඒ ශ්‍රේණිවල මහජන පුස්තකාල විසින් පවත්වා ගෙන යායුතු අවම ප්‍රමිතීන් පුස්තකාල සේවා මණ්ඩලය හඳුන්වා දී ඇති අතර එම ප්‍රමිතීන් කාලානුරූපව සංශෝධනය කිරීමේ කටයුතුවල මණ්ඩලය දැනට නිරතවී සිටී.

### 4.1.3 පුස්තකාල කමිටු සංවිධානය

ප්‍රදේශීය සභා මට්ටම්වලින් පුස්තකාල කමිටු සංවිධානය 1991 වසරේදී පුස්තකාල සේවා මණ්ඩලය හඳුන්වා දුන් තවත් නව පියවරකි. මේ අනුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා පළාතේ පුස්තකාල කමිටුවේද සභාපති වන අතර, ප්‍රාදේශීය ලේකම්වරයා එහි උපසභාපතිද, පළාතේ ප්‍රධාන මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපති කමිටු ලේකම් ලෙසද කටයුතු කරයි. ප්‍රදේශයේ විදුහල්පතිවරුන්, පරිවෙණාධිපතිවරුන් ඇතුළු සැම අංශයකින්ම නියෝජිතයන් කමිටුවට ඇතුළත්වේ. ඒ මගින් ප්‍රදේශයේ මහජන පුස්තකාල, පාසැල් පුස්තකාල හා පිරිවෙන් පුස්තකාල ඇතුළු සැම පුස්තකාල සේවාවකම ඒවායේ මෙතෙක් පැවති හුදෙකලා බව වෙනුවට යම් පමණක සම්බන්ධීකරණයකට ලක්කර ඇත. එසේම අදාළ ප්‍රදේශයේ පුස්තකාල සේවාවන් පොදුවේ සැලසුම් කිරීමටත්, සීමිත සම්පත් උපරිම ඵල ලැබෙන පරිදි යොදා ගැනීමටත් පහසුකම් සලසා ඇත.

### 4.1.4 පුස්තකාල ශ්‍රේණිගත කිරීම

මහජන පුස්තකාල ශ්‍රේණිගත කිරීම පුස්තකාල සේවා මණ්ඩලයට මෙම ක්ෂේත්‍රයේ පැවරී ඇති ප්‍රධාන වගකීමක් වේ. ඒ ඒ පුස්තකාලවල අදාළ තනතුරු ඇතිකරලීම එම පුස්තකාලයේ ශ්‍රේණිය අනුව තීරණය වන බැවින් මෙය ඉතා වැදගත් කාර්ය භාරයක්වී ඇත. පුස්තකාල අධිකාරීන් තම පුස්තකාල ඉහළ ශ්‍රේණියකට ඇතුළත් කර ගැනීම සඳහා අදාළ පුස්තකාලයේ තත්ත්වය උසස් කර ගැනීමේ විශේෂ ප්‍රයත්නයන්හි යෙදීම පසුගිය කාලය තුළ දක්නට ලැබුණි.

### 4.1.5 පුස්තකාල සංවර්ධන උපදෙස්

මහජන පුස්තකාල ගොඩනැගිලි සැලසුම් කිරීම, ලීබඩු උපකරණ සැලසුම් කිරීම, පුස්තකාලයේ අභ්‍යන්තරය සැලසුම් කිරීම හා සංවිධානය, පුස්තකාල සේවා සැලසුම් කිරීම ආදී සෑම වෘත්තීයමය කාර්යයක් සඳහාම පුස්තකාල සේවා මණ්ඩලයෙන් උපදෙස් ලබාගත හැක. බොහෝ අවස්ථාවල මණ්ඩලයේ නිලධාරීන් අදාළ පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් සහ පුස්තකාලයාධිපතීන් හමුවී මේ පිළිබඳ උපදෙස් දෙනු ලැබේ.

### 4.1.6 පුහුණු පාඨමාලා

මහජන පුස්තකාලයාධිපතීන්, පුස්තකාල සහායකයින්, පොත් බැඳුම්කරුවන් ඇතුළු පුස්තකාල ක්ෂේත්‍රයේ විවිධ අය සඳහා වාර්ෂිකව පාඨමාලා හා සම්මන්ත්‍රණ පුස්තකාල සේවා මණ්ඩලය මගින් සංවිධානය කෙරේ. මීට අමතරව සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන්, ප්‍රජා සංවර්ධන නිලධාරීන්, පළාත් පාලන ආයතනවල ලේකම්වරුන් වැනි අය සඳහාද පුස්තකාල සේවාවල වැදගත්කම පැහැදිළි කිරීමේ වැඩමුළු පවත්වනු ලැබේ.

### 4.1.7 ග්‍රන්ථ විඥාපන සේවා

මහජන පුස්තකාලවලට පොත්පත් තෝරා ගැනීම සඳහා අවශ්‍ය වන **ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය** (මාසික හා වාර්ෂික) **පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය** (1738-1885), **ළමා ග්‍රන්ථ නාමාවලිය, විශේෂ ග්‍රන්ථ නාමාවලීන්** සම්පාදනය වැනි ග්‍රන්ථ විඥාපන සේවා පුස්තකාල සේවා මණ්ඩලය මගින් නිරතුරුවම සැපයේ. මෙම ප්‍රකාශන අධාරයෙන් මහජන පුස්තකාල සඳහා සුදුසු

පොත්පත් තෝරා ගැනීමට පහසුකම් ලැබේ. මණ්ඩලයේ ග්‍රන්ථ විඥාපන සේවා පිළිබඳ තොරතුරු මේ සමඟ අමුණා ඇත.

## 4.2 ද්‍රව්‍යමය ආධාර

### 4.2.1 පුස්තකාල සඳහා දැව භාණ්ඩ හා උපකරණ

සෑම වසරකම පුස්තකාල සේවා මණ්ඩලය මගින් අලුතින් පුස්තකාල ගොඩනැගිලි ඉදිකරන පුස්තකාල 75 කට පමණ පුස්තකාල දැව භාණ්ඩ සහ උපකරණ කට්ටල ලබාදේ. මෙහි අරමුණ විද්‍යානුකූලව සැකසුණු නව පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීමට පළාත් පාලන ආයතන අධිකාරීන් පෙළඹවීම වේ. මණ්ඩලය මගින් ලබාදෙන උපකරණ කට්ටලයට කියවීම් මේස, පුටු, පොත් රාක්ක, වාරසඟරා රාක්ක, සූචි කැබිනට්ටු, පුවත්පත් පුවරු, පුස්තකාලයාධිපති මේස ආදිය ඇතුළත් වේ.

### 4.2.2 සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම

මහජන පුස්තකාලවල පොත්පත් අලුත්වැඩියාව සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පොත් බැඳුම්හල් හා සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩපිළිවෙළක් පුස්තකාල සේවා මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ යටතේ මහජන පුස්තකාල ආශ්‍රිතව වසරකට නව සංරක්ෂණ මධ්‍යස්ථාන 30 ක් පමණ පිහිටුවනු ලැබේ. මෙම ව්‍යාපෘතිය යටතේ මණ්ඩලය මගින් පොත් බැඳුම් උපකරණ කට්ටලයක් සහ අදාළ නිලධාරියාට පොත් බැඳීම සහ සංරක්ෂණය පිළිබඳ වෘත්තීයමය පුහුණුවක් ලබාදේ. තම පුස්තකාලයේ පොත් පත් සංරක්ෂණය කිරීම මෙන්ම තම සේවාව පළාතේ වෙනත් පුස්තකාලවලට සහ පෞද්ගලික පුස්තකාල සඳහා අළෙවි කරලීමද අදාළ සංරක්ෂණ මධ්‍යස්ථානවලින් අපේක්ෂා කෙරේ.

### 4.2.3. පොත් අධාර

සෑම වර්ෂයකම පුස්තකාල සේවා මණ්ඩලය මගින් රුපියල් මිලියන 03 ක් පමණ වටිනා පොත් පුස්තකාල අතර බෙදා හරිනු ලැබේ. මෙම පරිත්‍යාගවලින් විශාල ප්‍රමාණයක් ආර්ථික අතින් දුර්වල ග්‍රාමීය ප්‍රදේශවල මහජන පුස්තකාල සඳහා යොමු කෙරේ. මීට අමතරව මණ්ඩලයේ පොත් අළෙවිහල මගින් සහ දිවයින පුරා පැවැත්වෙන පොත් ප්‍රදර්ශනවලින් මහජන පුස්තකාල සඳහා විශේෂ අඩු මිලකට පොත් ලබා ගැනීමේ පහසුකම් සලසා ඇත.

## 5. මහජන පුස්තකාල සේවා පිළිබඳ ජාතික සැලැස්ම

මීට ඉහත සඳහන් කළ පරිදි දිවයිනේ මහජන පුස්තකාල සේවාවන් පළාත් සභා ක්‍රමය යටතේ වඩාත් විද්‍යානුකූලව සංවිධානය කිරීම සඳහා **පළාත් සභා පුස්තකාල සැලැස්ම** නමින් සැලැස්මක් පුස්තකාල සේවා මණ්ඩලය විසින් සම්පාදනය කරන ලදී. මෙම සැලැස්මේ ප්‍රධාන අරමුණු වනුයේ පළාත් සභා යටතේ ඇති පුස්තකාල සේවාවන් සම්බන්ධීකරණය කරලීමත්, මනාව සංවිධානය කරලීමත් වේ. මෙම සැලැස්ම සියලුම පළාත් සභාවලට ඉදිරිපත් කරන ලද අතර, පළාත් සභා ගණනාවක්ම (බස්නාහිර, මධ්‍යම, දකුණ, සබරගමුව) යම් යම් සංශෝධන සහිතව මෙම සැලැස්ම **පුස්තකාල ප්‍රඥප්ති** වශයෙන් දැනටමත් සම්මත කරගෙන තිබේ. මෙම පළාත් සභා පුස්තකාල සැලැස්ම යටතේ පළාත් මධ්‍ය පුස්තකාල අධිකාරියක්ද, මධ්‍ය පුස්තකාලයක්ද, සියලුම පුස්තකාල සම්බන්ධ කෙරෙන පළාත් පුස්තකාල ජාලයක්ද පිහිටුවේ. **මධ්‍යම පළාත් පුස්තකාල ප්‍රඥප්තියේ** පිටපතක් මේ සමඟ අමුණා ඇත.

## 5.1 පළාත් මධ්‍ය පුස්තකාල අධිකාරිය

දැනට පළාත් මට්ටමින් පුස්තකාල සේවාවන් මහජන, පාසැල් ආදී වශයෙන් වෙන් වෙන් වශයෙන් ක්‍රියාත්මක වන අතර, ඒ ඒ පුස්තකාල සේවාවන්ද පොදු සැලැස්මකින් තොරව, හුදෙකලා පුස්තකාල සේවා ලෙස ක්‍රියාත්මක වේ. පුස්තකාල සේවාව ක්‍රමානුකූලව සංවර්ධනය කිරීම සඳහා යම් මට්ටමක මධ්‍යගත අධිකාරියක් පළාත් මට්ටමින් ක්‍රියාත්මකවීම ලෝකයේ උසස් පුස්තකාල සේවා ඇති සෑම රටකම දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. ඒ මගින් අදාළ පළාතේ පුස්තකාල සේවාවන් සැලසුම් සහගතව සංවර්ධනය කිරීමටත්, අනවශ්‍ය ද්විතීයකරණය වැළැක්වීමටත් හැකි වේ. මේ අනුව **පළාත් සභා පුස්තකාල සේවා මණ්ඩලය** නම් වූ අධිකාරි ආයතනයක් සෑම පළාතකම පිහිටුවීමට යෝජනා කර ඇත. මෙම මණ්ඩලයට පළාත් සභාවේ පුස්තකාල කටයුතුවලට සම්බන්ධ සෑම අමාත්‍යාංශයකම ලේකම්වරුන් හා ප්‍රධාන නිලධාරීන්ද, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නියෝජිතයන්ද, ප්‍රධාන අමාත්‍යවරයා හෝ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා නම් කරන නියෝජිතයන්ද ඇතුළත් වේ.

මෙම පළාත් පුස්තකාල සේවා මණ්ඩලය මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ජාතික මට්ටමින් ඉටු කරන කාර්යය පළාත් මට්ටමින් ඉටු කෙරේ. පළාතේ මහජන පුස්තකාල, පාසැල් පුස්තකාල හා ජංගම පුස්තකාල ඇතුලු සියලුම

පුස්තකාල සේවා සැලසුම් කිරීමේ කාර්යය ඒ මගින් සිදු වේ. මුලදී මෙන් එක් එක් ප්‍රදේශයක් හෝ එක් ආයතනයක් ගැන පමණක් අවධානය යොමු නොකොට මුළු පළාතේම අවශ්‍යතා සලකා සැලසුම් සකස් කරන බැවින් මේ යටතේ වඩාත් ඵලදායී ලෙස පුස්තකාල සේවාව සංවිධානය කළ හැකිවේ.

එසේම පළාතේ පුස්තකාල විශාල ප්‍රමාණයක් සඳහා මෙම මධ්‍ය මණ්ඩලයෙන් එක්වර පොත්පත් හා වෙනත් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී ඒ සඳහා විශාල වට්ටමක් ලබා ගැනීමට හැකිවීම, ප්‍රලේඛන විඥාපන සේවා, නව තාක්ෂණය හඳුන්වාදීම වැනි කරුණුවලදී ඒවා මධ්‍යගතව සිදු කිරීම නිසා වාසිසහගත තත්ත්වයක් ඇතිවීම වැනි කරුණු ද මෙහිදී සැළකිල්ලට ගෙන ඇත.

## 5.2 පළාත් මධ්‍ය පුස්තකාලය

සෑම පළාතකම **පළාත් මධ්‍ය පුස්තකාලය** නමින් මධ්‍ය පුස්තකාලයක් පිහිටුවනු ලැබේ. එය අදාළ පළාතේ ප්‍රධාන විමර්ශන පුස්තකාලය වන අතර, පළාතේ අනිකුත් පුස්තකාලවල මව් පුස්තකාලය ලෙසද කටයුතු කරනු ලබයි. ඒ මගින් වෙනත් පුස්තකාලවලට පොත් පිරුළට ලබාදීම, පොත් සංරක්ෂණය වැනි මධ්‍යගත සේවා පවත්වා ගෙනයාම, නව තාක්ෂණය හඳුන්වාදීමේ මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම ආදී සේවාවන් රාශියක් අපේක්ෂා කෙරේ. එසේම අදාළ පළාතේ ඉතිහාසය, සංස්කෘතිය සහ වෙනත් ප්‍රාදේශීය ලක්ෂණ පිළිබිඹු කෙරෙන විශේෂ ග්‍රන්ථ හා පුස්තකාල ද්‍රව්‍ය එකතුවක් පවත්වා ගෙන යාමද එහි වගකීමක් වේ. දීර්ඝකාලීනව මෙම පළාත් මධ්‍ය පුස්තකාල ක්‍රමය දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල ක්‍රමය දක්වා ව්‍යාප්ත වීම අපේක්ෂා කෙරේ.

## 5.3 පළාත් පුස්තකාල ජාලය

පළාතේ සියලුම පුස්තකාල සම්බන්ධ කොට **පළාත් පුස්තකාල ජාලය** පිහිටවනු ලබන අතර ඒ මගින් අදාළ සම්පත් නියමාකාරව බෙදී යාම, පුස්තකාල අතර අන්‍යොන්‍ය සහාය වර්ධනයවීම හා වඩාත් ක්‍රමානුකූලව පුස්තකාල සේවාව සංවර්ධනය අපේක්ෂා කෙරේ. දැනට මහජන පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රධාන ගැටලුවක්වී පවත්නා ඒ ඒ මහජන පුස්තකාල තනිවී හුදෙකලාව කටයුතු කිරීම මේ මගින් ඉවත්වේ.

## 6. ශ්‍රී ලංකාවේ අනාගත මහජන පුස්තකාල සේවාව සැලසුම් කිරීමේදී අවධානය යොමු කල යුතු කරුණු

### 6.1 තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ සීඝ්‍ර වර්ධනය

පසුගිය දශක කිහිපයේත්, විශේෂයෙන් පසුගිය වසර කිහිපය තුලත් සිදුවූ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සීඝ්‍ර වර්ධනය අප ජීවත්වන ලෝකයේ මුහුණුවර වෙනස් කරමින් සිටී. මෙහි ප්‍රතිඵලයක් ලෙස 'දැනුම' ඉතාමත් තීරණාත්මක ආර්ථික සම්පත ලෙස අනෙකුත් සියලුම සම්පත් අභිබවා ඉදිරියට පැමිණ ඇත. පසුගිය දශක කිහිපය තුල ඇතිවූ විශ්මය ජනක විද්‍යා තාක්ෂණ වර්ධනය හේතුවෙන් සෑම ක්ෂේත්‍රයකම නව දැනුම පිරි ඉතිරී යමින් පවතී. අප දන්නා සෑම ක්ෂේත්‍රයකම නව සොයා ගැනීම් හා නව පර්යේෂණ සෑම මොහොතකම සිදුවන අතර මිනිස් වර්ගයාගේ ඉහළම ගනයේ බුද්ධිමතුන් හා විද්‍යාඥයින් සිය දහස් ගණනක් මෙම කාර්යයේ නිරතුරුවම නියැලී සිටී. පසුගිය වසර ගණනාව තුල ඇදහිය නොහැකි තරම් වේගයෙන් දියුණුවූ පරිගණක තාක්ෂණය මෙම වර්ධනයේ වේගය තව දුරටත් තීව්‍ර කර ඇත. 1960 දශකයේදී මිනිසා සතු මුලු දැනුම් සම්භාරය සෑම වසර 20 කට වරක් දෙගුණ වීමේ ප්‍රවණතාවයක් පැවති අතර 1990 දශකයේ මැද භාගයේදී එම දෙගුණ වීම සෑම වසර 5 කටම වරක් ලෙස වර්ධනය වී ඇත.

මීට කලකට පෙර මෙන් මෙම දැනුම එක් තැනකට හෝ එක් රටකට සීරවීමක් වර්තමානයේ දැකිය නොහැක. **පණිවුඩ හුවමාරු චන්ද්‍රිකා හා ෆයිබර් ඔප්ටික් කේබල්** මගින් තොරතුරු තත්පර කිහිපයකින් මුලු ලොව වටා යැවීමේ හැකියාව ලැබී ඇත. නවීන විදුලි සන්දේශ ජාලය හා නවීන පරිගණක එක්වී නිර්මානය වුණු **අන්තර් ජාලය** (Internet) අද ලෝකයේ ප්‍රධානතම තොරතුරු ගවේෂණ මාර්ගය බවට පත්ව ඇත. **ආර්ථික වශයෙන් 18 වන සියවසේ වරායවල් හා 19 වන හා 20 වන සියවස්වල මහා මාර්ග හා දුම්රිය මාර්ග අත් කරගෙන තිබූ ස්ථානය 20 වන සියවසේ අවසන් වසර කිහිපය තුලත් 21 වන සියවසේ මුල් දශකවලත් අන්තර් ජාලයට හිමිවෙමින් පවතී.** අන්තර් ජාලයද දැන් ක්‍රමික විකාශනයකට පත්වෙමින් පවතින අතර අනාගතයේදී **අන්තර් ජාලය 2** (Internet 2) ලෙස එය වඩාත් පුලුල් ලෙස වර්ධනයවීමක් පෙන්නුම් කරයි.

එක් අතකින් දැනුම ප්‍රධාන ආර්ථික සාධකයක් වී ඇති අතර අනෙක් අතට අන්තර් ජාලය දැනුම හා තොරතුරු සපයන ප්‍රධාන තම මාධ්‍යය බවට පත්වී ඇත. මේ හේතුවෙන් **ලෝකය හා සම්බන්ධවීම** (Connectivity) අද ප්‍රධාන තම උද්ධෘත පාඨය වී තිබේ. සංවර්ධනය වූ රටවල් තම තත්ත්වයන් තහවුරු කර ගැනීමටත්, සංවර්ධය වෙමින් පවත්නා රටවල් සීඝ්‍ර සංවර්ධනයක් සඳහාත් මෙම 'සම්බන්ධවීම්' ඔස්සේ 'දැනුම' නැමැති ආර්ථික සම්පත තම රටවල් තුලට ගලා ඒමට පහසුකම් සැලසීමේ විශාල ප්‍රයත්නයක නියැලී සිටී.

අපේ වටපිටාව මිනිස් ඉතිහාසයේ නොවූ විරූ අන්දමට වේගයෙන් වෙනස් වෙමින් පවතී. **තොරතුරු පිපිරීම** (Information Explosion), **දැනුම් ආර්ථිකය** (Knowledge Economy) වැනි විවිධ පදවලින් මෙය අර්ථ කථනය කිරීමට උත්සාහ දරා ඇත. ලෝකය කෙතරම් වේගයෙන් වෙනස් වේද යත් **2010 අපගේ දරුවන් විසින් කරනු ලබන රැකියාවන් තවම සොයා ගෙන නැතැයි ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රමුඛ විද්‍යාඥයකු මෑතදී පවසා තිබුණි.**

මේ අනුව වෙනත් රටවල මෙන්ම ශ්‍රී ලංකාවේත් අනාගතය අප ජනතාව මෙම නව දැනුම් සම්භාරයට සම්බන්ධ කර ලීමේ හැකියාව මත තීරණය වනු ඇත. මෙහිදී මහජන පුස්තකාල ජනතාවගෙන් 80% කට පමණ ප්‍රමාණයකට තොරතුරු සපයන එකම ආයතනය වන බැවින් එය තම කාර්ය භාරය සාර්ථකව ඉටු කරලීම මත ජාතියේ අනාගත සාර්ථකත්වය බොහෝ දුරට රඳා පවතිනු ඇත. මහජන පුස්තකාල තව දුරටත් සම්ප්‍රදායික **'නිද්‍රාශීලී', ජනතාවගේ විවේක කාලය සතුටින් ගත කිරීමට උදව් කරන ආයතන පමණක් නොවිය යුතු වේ. ඒවා ජාතියට දැනුම බෙදා දෙන, අපේ දරුවන් 21 වන සියවසට ගැලපෙන සේ පුහුණු කිරීමට උදව් වන, ජාතියේ ජීවනාලීන් ලෙස කටයුතු කරන, විශ්ව දැනුම ගමට ගෙන එන ආයතන විය යුතුවේ.** මෙම නව තත්ත්වයන් අප හැම දෙනාම නිවැරදිව අවබෝධ කර ගැනීමත්, ඒ අනුව අනාගත සැලසුම් සකස් කිරීමත් අත්‍යවශ්‍ය වේ. (Library should be the agency with the mandate to bring equitable access to the Information Super Highway to all citizens.)

## 6.2 ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍රයේ වර්ධනය

පසුගිය වසර කිහිපය තුල ශ්‍රී ලංකාව මෙම අභියෝගයට මුහුණදීම සඳහා විවිධ අංශවලින් නව පියවරයන් ගෙන තිබේ. පසුගිය වසරේ රජය මගින් පරිගණක සඳහා

එතෙක් අය කරමින් තිබූ 45% බද්ද සම්පූර්ණයෙන් ඉවත් කළ අතර, ඒ මගින් පරිගණක මිලට ගැනීමේ පහසුකම් වැඩිකර තිබේ. එසේම විදුලි සංදේශ සේවාව සඳහා පැවති රජයේ ඒකාධිකාරය ඉවත් කරලීම නිසා ද ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාලය සංවර්ධනය කිරීම සඳහා අතිවිශාල මුදලක් වැය කිරීම නිසාද විදුලි සංදේශ පහසුකම් රටේ සෑම අස්සක් මුල්ලක් පාසාම පැතිරෙමින් පවතී. මෙම පසුබිම යටතේ 'ඉන්ටර්නෙට්' හෙවත් අන්තර් ජාල සේවාවද, රට තුළ ක්‍රමානුකූලව ව්‍යාප්ත වීමක් පෙනේ. 1998 සැප්තැම්බර් මාසය වනවිට අන්තර් ජාල සේවා සපයන (ISP) සමාගම් 08 ක් ලංකාවේ ක්‍රියාත්මක විය. දැනට ඉන්ටර්නෙට් සම්බන්ධතා 12,000 ක් රට පුරා ඇති අතර එය තවදුරටත් වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. ශ්‍රී ලංකාව පිළිබඳ 'වෙබ් අඩවි' 5000 කට අධික ප්‍රමාණයක් දැනට ඇති අතර, දේශීය පෞද්ගලික 'වෙබ් අඩවි' 800 ක පමණ ප්‍රමාණයක් ඇත. සතිපතා පුවත්පත් 05 ක් සහ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පලවන දිනපතා පුවත්පත් 03 ක් දැනටමත් තම ප්‍රකාශන ඉන්ටර්නෙට් ජාලයට සම්බන්ධ කර ඇත.

පාසැල්, උසස් අධ්‍යාපන ආයතන මෙන්ම පෞද්ගලික අධ්‍යාපන ආයතනවලද පරිගණක විද්‍යාව හැදෑරීම ක්‍රම ක්‍රමයෙන් ජනප්‍රිය වෙමින් පවතී. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙන්ම විවිධ ආධාර ව්‍යාපෘතීන් යටතේ පරිගණක පාසැල්වලට හඳුන්වා දීමේ පුලුල් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ අන්දමට වේගයෙන් ලංකාවේ ව්‍යාප්ත වන මෙම තොරතුරු තාක්ෂණය පොදු මහජනතාව අතරට ගෙනයාමේ වගකීම පළාත් පාලන ආයතන පුස්තකාල සතුවේ. 1998 ජූනි මස ලංකාදීප පුවත්පත මගින් කරන ලද ඉන්ටර්නෙට් සමීක්ෂණයේදී 79% ක් පවසා සිටියේ තමන්ට ඉන්ටර්නෙට් පෞද්ගලිකව ලබාගත නොහැකි බැවින් රජය ඒ සඳහා මැදිහත් විය යුතු බව වේ. මේ දිනවල පැවැත්වෙන INFOTEL LANKA '98 ප්‍රදර්ශනය මේ ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවේ ඇති අසීමිත උනන්දුවට හොඳ නිදසුනකි.

## 6.3 අධ්‍යාපනික සංවර්ධනය හා පුස්තකාල සේවාව

රජයේ නව අධ්‍යාපන සැලසුම් යටතේ අධ්‍යාපනය ලබාදීමේ නව මාර්ග තවදුරටත් පුළුල් කරලීමට යෝජනා කර තිබේ. විශේෂයෙන්ම 14% ක් පමණ වූ පාසැල් යායුතු නමුත් පාසැල් නොයන ළමුන්ගේත්, විවිධ හේතු නිසා අතරමගදී පාසැල්වලින් ඉවත්වන ළමුන්ගේත්, මූලික පාසැල් අධ්‍යාපනය ලබා නතරවන මෙන්ම

විවිධ දුෂ්කරතා මැද අධ්‍යාපන කටයුතු කරගෙන යන ශිෂ්‍යයන්ගේත් යහපත සඳහා මනාව සංවිධානයවූ මහජන පුස්තකාලවලින් ලබාදිය හැකි ආධාරය ඉතා විශාල වේ. මීට අමතරව තරුණ කොමිෂන් සභාව මීට පෙර යෝජනා කළාත් මෙන් ඒ ඒ ප්‍රදේශවල රැකියා නොමැති තරුණයන් සඳහා ස්වයං අධ්‍යාපනය මෙන්ම ස්වයං රැකියා ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය තොරතුරු ලබාදිය හැකි හොඳම මාර්ගයද මහජන පුස්තකාල සේවාව වේ.

## 6.4 විවෘත ආර්ථික ක්‍රමය, ජාතික සංවර්ධනය හා තොරතුරු සේවාව

විවෘත ආර්ථික ක්‍රමය යටතේ ලබාගත හැකි උපරිම ඵල ජනතාවට ලබාදීම සඳහා උසස් මට්ටමේ පුස්තකාල හා තොරතුරු සේවාවක් අවශ්‍ය වේ. විවිධ භාණ්ඩ හෝ පාරිභෝගික ද්‍රව්‍ය විද්‍යාත්මක නිෂ්පාදන ක්‍රම, ඒ සඳහා ඇති දේශීය හා විදේශීය වෙළඳ පොල තොරතුරු ඇතුළු විවිධ අංශ පිළිබඳ තොරතුරු සාමාන්‍ය ජනතාවට පහසුවෙන් ලබාගත හැකි මාර්ගය තම ප්‍රදේශයේ මහජන පුස්තකාල සේවාව වේ. විශේෂයෙන්ම නව තාක්ෂණය සහිත පුස්තකාල සේවාව පොදු මහජනතාව ලෝකය නිරීක්ෂණය කරන කවුළුවක් විය යුතුවේ. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික කෘෂිකර්ම භෝග වගාව, විවිධ කර්මාන්ත ඇතුලු සියලුම ආර්ථික කටයුතු සඳහා නවීන විද්‍යාත්මක දැනුම භාවිතා කරමින් ඒවායින් උපරිම ඵල නෙලා ගත යුතුව ඇත. රටට ගැලපෙන නව ආර්ථික කටයුතු ආරම්භ කල යුතු අතර ඒවා ලෝක වෙළඳපලෙන් එල්ලවන තරඟයට මුහුණදීමට හැකි තත්ත්වයක තිබිය යුතුවේ. වර්තමාන තරඟකාරී ලෝකයේ ඕනෑම ක්ෂේත්‍රයක ජය ගැනීමට නම් ශ්‍රී ලාංකිකයා අවශ්‍ය දැනුමින් සන්නද්ධ කල යුතුවේ.

## 6.5 ප්‍රජාතන්ත්‍රීකරණය හා බලතල විමධ්‍යගත කරලීම

බලතල විමධ්‍යගත කරලීම හා ප්‍රජාතන්ත්‍රීකරණය ආර්ථාන්විත වීමට නම් රටේ සෑම ප්‍රදේශයකම ජීවත්වන සෑම ජන කොටසකටම නිවැරදි හා පැහැදිලි තොරතුරු ලබා ගැනීමේ ක්‍රමයක් පැවතිය යුතුවේ. එසේම පළාත් පාලන ක්ෂේත්‍රයේ වැදගත් අංශ වන සංවර්ධනය, කළමනාකරණය, පාරිසරික ප්‍රශ්න වැනි අංශ පිළිබඳ පුළුල් අවබෝධයක් ජනතාවට මෙන්ම පළාත් පාලන ආයතන ප්‍රධානීන්ටද ලබාගත හැකි වනුයේ ඒ පිළිබඳ නිවැරදි හා අලුත්ම දැනුම ලබාගත හැකිවූවොත් පමණකි.

## දෙවන කොටස - නිර්දේශ

## 7. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ යෝජනා හා නිර්දේශ

### 7.1 'මහජන පුස්තකාල සේවාව' යන නාමය 'මහජන පුස්තකාල සහ තොරතුරු සේවාව' ලෙස වෙනස් කිරීම

**'මහජන පුස්තකාල සේවාව' 'මහජන පුස්තකාල සහ තොරතුරු සේවාව'** ලෙස වෙනස් කිරීමට ප්‍රධාන හේතුව ඉහත සඳහන් කළ නව වර්ධනයන් හා ප්‍රවනතා මගින් නවීන පුස්තකාල සේවාවේ මුහුණුවර වෙනස්වීම වේ. ඒ අනුව මෙතෙක් මහජන පුස්තකාල සේවාවේ මූලික පරමාර්ථය ලෙස සැලකුණු **'මහජනතාවට තම විවේක කාලය හොඳින් ගත කිරීමට අවශ්‍ය කියවීමේ පහසුකම් සැපයීම'** යන්න වෙනුවට නූතන මහජන පුස්තකාලවල මූලික පරමාර්ථය **'ජාතික සංවර්ධනයට අත්‍යාවශ්‍ය දැනුම සහ තොරතුරු සමාජයේ සැම ජන කොටසකටම සැපයීම'** ලෙස වෙනස්වීම වේ. ඒ අනුව මහජන පුස්තකාලවලින් අපේක්ෂිත මෙම වැදගත් කාර්ය භාරය එහි නාමයෙන්ද පිළිබිඹු වීම සුදුසු යයි යෝජනා කරමු.

### 7.2 පුස්තකාල සහ තොරතුරු සේවාව පළාත් පාලන ආයතනවල ප්‍රමුඛ සහ අවශ්‍ය සේවාවක් බවට පත් කිරීම

මහජන පුස්තකාල සේවාව පළාත් පාලන ආයතන මගින් පවත්වනු ලබන ප්‍රමුඛ සේවාවක් නොවන අතර එය බොහෝ පළාත් පාලන ආයතනවල පසු පෙළ සේවා අතරට ගැනේ. ඒ අනුව මහජන පුස්තකාල සේවාව පළාත් පාලන ආයතනවල මෙන්ම ජාතික මට්ටමේ පුස්තකාල සේවා අතරද පහළම තත්ත්වයේ පැවතීමට මේ තත්ත්වය හේතුවී ඇත. මුලදී සඳහන් කළ පරිදි පළාතේ අධ්‍යාපනික, සංස්කෘතික ආර්ථික සහ සමාජයීය සංවර්ධනයේලා තීරණාත්මක මෙහෙයක් ඉටුකළ යුතු පුස්තකාල හා තොරතුරු සේවාව පළාත් පාලන ආයතනවල ප්‍රමුඛතා ලේඛනයේ ඉහළින් පැවතිය යුතු අංශයක් වේ. මෙම සේවාවේ වැදගත්කම ගැන කිසිදු විවාදයක්

නොමැති බැවින් පුස්තකාල හා තොරතුරු සේවාව සෑම පළාත් පාලන ආයතනයකම ප්‍රමුඛ හා අවශ්‍ය සේවාවක් ලෙස ව්‍යවස්ථාපිත කිරීම නිර්දේශ කරමු.

## 7.3 මහජන පුස්තකාල හා තොරතුරු සේවාව සඳහා අවශ්‍ය පමණ මුදල් වාර්ෂිකව ප්‍රතිපාදනය කිරීම

පුස්තකාල හා තොරතුරු සේවාවේ වැදගත් බව ප්‍රතිපත්තියක් ලෙස පිළිගැනීමෙන් පමණක් මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනයක් අපේක්ෂා කළ නොහැක. එය ක්‍රියාත්මක කරලීම සඳහා වාර්ෂිකව ස්ථිර මුදල් ප්‍රතිපාදනය කරලීම මෙහිදී බලපානු ලබන තීරණාත්මක සාධකය වේ. දැනට බොහෝ පළාත් පාලන ආයතන පුස්තකාල සඳහා විශේෂ මුදල් ප්‍රතිපාදනයක් කරනු නොලබන අතර, බොහොමයක් පළාත් පාලන ආයතන වසර අවසානයේදී ඉතිරිවන මුදල් පුස්තකාල සඳහා යොදා ගැනීමක් පෙනේ. සමස්තයක් ලෙස මහජන පුස්තකාල සේවා සඳහා යොදනු ලබන මුදල් ප්‍රමාණය ඉතාමත් සීමිත වීම වර්තමාන මහජන පුස්තකාල සේවාවේ දුබලතාවට තුඩුදී ඇති ප්‍රධාන සාධකය වේ. එබැවින් සෑම පළාත් පාලන ආයතනයක්ම තම වාර්ෂික මුදල් ප්‍රතිපාදනවලින් ස්ථිර ප්‍රතිශතයක් පුස්තකාල හා තොරතුරු සේවාව සඳහා යොදා ගත යුතු බව ව්‍යවස්ථා ගත කිරීම සුදුසු යයි නිර්දේශ කරමු. එසේම සෑම පළාත් සභාවක්ම අදාළ පළාතේ පුස්තකාල අවශ්‍යතා සැලකිල්ලට ගෙන ඒවායේ අභිවෘද්ධිය සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමද ව්‍යවස්ථාපිත කළ යුතුවේ.

## 7.4 යෝජිත පළාත් සභා පුස්තකාල ව්‍යුහය ව්‍යවස්ථාපිත කිරීම සහ එය ක්‍රියාත්මක කරලීමට අවශ්‍ය පහසුකම් සැකසීම

මුලදී සඳහන් කළ අන්දමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විවිධ පළාත් සභා සමඟ සාකච්ඡා කොට නිර්දේශ කරන ලද සහ දැනට පළාත් සභා ගණනාවක පුස්තකාල ප්‍රඥප්ති වශයෙන් සම්මත වී ඇති පළාත් සභා පුස්තකාල ව්‍යුහය ක්‍රියාත්මක කරලීම නිර්දේශ කරමු. පසුගිය වසර කිහිපය තුළ ලැබූ අත්දැකීම්වලින් පෙනීගිය කරුණක් වනුයේ පුස්තකාල ප්‍රඥප්ති පළාත් සභා මට්ටමින් සම්මත වුවද ඒවා සාර්ථකව ක්‍රියාත්මක වීමට බාධා වන කරුණු ගණනාවක් පවතින බව වේ. මෙම ආයතන සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල හා මුදල් ලබා නොදීම, පළාත් සභා මට්ටමේ විවිධ අමාත්‍යාංශවල නිලධාරීන් තමන් සතු පුස්තකාල වගකීම් සහ කාර්ය භාරය වෙනත් ආයතනයකට පැවරීමට ඇති අකමැත්ත සහ යහපත් පුස්තකාල හා තොරතුරු සේවාවක් මඟින් පළාතට සිදුවිය හැකි යහපත පිළිබඳව දේශපාලන හා

නිලධාරි මට්ටමේ ඇති අනවබෝධය මෙම කරුණු අතර මුල් තැනක් ගනී. එබැවින් විමධ්‍යගත පාලන ක්‍රමයක් යටත පුස්තකාල සේවාව සංවිධානය කෙරෙන මෙම ව්‍යුහය ව්‍යවස්ථාපිත කරලීම අවශ්‍ය වේ.

## 7.5 මහජන පුස්තකාලයාධිපති සේවාව ප්‍රතිසංවිධානය කරලීම.

විවිධ ආයතන සංවිධාන මගින් දැනටමත් කරුනු ඉදිරිපත් කර ඇති ආකාරයට පළාත් පාලන පුස්තකාලයාධිපති සේවාවේ දුක් ගැනවිලි හා ගැටලු රාශියක් ඇත. බඳවා ගැනීමේ සුදුසුකම්, උසස්වීම්, වැඩිදුර පුහුණු පහසුකම්, මාරුවීම් ආදී වශයෙන් මෙම ගැටලු අංශ කිහිපයකට වෙන් කළ හැක. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල මහජන පුස්තකාල සඳහා වෘත්තිය පුහුණු පුස්තකාලයාධිපතිවරු නොසිටීමත්, සේවයේ යේදී සිටින පුස්තකාලයාධිපතිවරුන්ටද අවශ්‍ය උසස්වීම් සහ වෙනත් වෘත්තීය වරප්‍රසාද ඉතා සීමිතව ලැබීමත් විශාල අසහනයකට හේතුවී තිබේ. මහජන පුස්තකාල සේවය පුරා පැතිර ඇති මෙම අසහනය, මහජන පුස්තකාල සේවාවේ දුර්වලතාවයට හේතු වී ඇති ප්‍රධාන සාධකය වේ. III වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු ලෙස සේවයට බැදී දශක තුනහතරකට පසු එම ශ්‍රේණියේම හෝ II ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු ලෙස විශ්‍රාම ගැනීමට සිදුවීම පළාත් පාලන සේවයේ දුර්ලභ සිද්ධියක් නොවේ. මෙම තත්ත්වයට පිළියමක් යොදා පළාත් පාලන පුස්තකාල සේවාව ආකර්ශනීය සේවාවක් කරලීම ජාතික අවශ්‍යතාවයක්ව පවතී.

## 7.6 මහජන හා පාසැල් පුස්තකාල අතර සමීප සම්බන්ධතාවයක් ඇති කරලීම

නව විමධ්‍යගත පාලන ක්‍රමය යටතේ ප්‍රදේශයේ ප්‍රධානතම පුස්තකාල සේවාවන් වන මහජන හා පාසැල් පුස්තකාල සේවා අතර සමීප සම්බන්ධතාවයක් තිබීම අතිශයින් වැදගත් වේ. මීට ඉහත සඳහන් කළ ප්‍රාදේශීය සභා පුස්තකාල කමිටු මගින් මෙම සම්බන්ධීකරනය ඇති කරලීමට පුස්තකාල සේවා මණ්ඩලය ප්‍රයත්න දැරුවද ඒ සඳහා ව්‍යවස්ථාමය පදනමක් නොතිබීම බාධකයක් වී ඇත. එකම ජනතාවකට සේවය කරන, එකම භූගෝලීය ප්‍රදේශයක පිහිටා ඇති මෙම පුස්තකාල තමන්ට අවශ්‍ය සම්පත් ලබා ගැනීම, සම්පත් බෙදා හදා ගැනීම හා නව තාක්ෂණය උපයෝගී කර ගැනීම වැනි කටයුතු වලදී සාමූහිකව ක්‍රියා කිරම දෙපාර්ශවයටම වාසිදායක වේ. ඒ සඳහා නිර්දේශ කොමිෂම මගින් ලබා දීම නිර්දේශ කරමු.

## 7.7 මහජන පුස්තකාල හා තොරතුරු සේවා සඳහා නව තාක්ෂණය භාවිත කළ යුතු බව අවධාරණය කරලීම

21 වන සියවසට එළඹෙමින් සිටින මේ අවදියේ පුස්තකාල හා තොරතුරු සේවා සඳහා නව තාක්ෂණය භාවිත කරලීම තව දුරටත් ඒ ඒ අංශ විසින් කළ යුතු තෝරා ගැනීමක් හෝ අනවශ්‍ය සුව පහසු වියදමක් හෝ නොවන බව අවධාරණය කරමු. නව තොරතුරු තාක්ෂණය හා එයින් ලබා ගත හැකි විපුල ඵල ප්‍රයෝජන පිළිබඳව විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් දැඩි උනන්දුවක් දැක්වීම අද අන්තර් ජාතික ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ප්‍රවනතාවකි. මීට අමතරව ශ්‍රී ලංකා රජය මේ සඳහා විශේෂ අවධානය යොමු කර ඇති අතර රට අදාළ **1998 විද්‍යාපන තාක්ෂණ වසර ලෙස නම් කිරීම** ඇතුළු මීට ඉහත සඳහන් කළ විශේෂ පියවර ගණනාවක් ගෙන ඇත. අන්තර් ජාලයට සම්බන්ධ නොවී නවීන තොරතුරු සේවාවක් සංවිධානය කරලීමක් ගැන අද කථා කළ නොහැකි අතර ඉදිරි වසර කිහිපය තුළ එම තත්ත්වය තවදුරටත් ස්ථාවර වනු ඇත. එබැවින් **සෑම මහ නගර සභා සහ නගර සභා පුස්තකාලත්, අවම වශයෙන් ප්‍රාදේශීය සභා මට්ටමේ පළමු ශ්‍රේණියේ පුස්තකාලත් අන්තර් ජාලයට සම්බන්ධ වී උසස් මට්ටමේ පුස්තකාල සේවා සැපයීම අනිවාර්ය කරලීම** නිර්දේශ කරමු.

## 7.8 මහජන පුස්තකාල හා තොරතුරු සේවාව තව දුරටත් ව්‍යාප්ත කරලීම

ශ්‍රී ලංකාවේ දළ වශයෙන් ගම් 15,000 ක් පමණ තිබුණ ද මහජන පුස්තකාල ඇත්තේ 1000 කට අඩු ප්‍රමාණයකි. මහජන පුස්තකාල හා තොරතුරු සේවාව මගින් අපේක්ෂිත ඉදිරි කාර්ය භාරය සාර්ථකව ඉටුකරලීම සඳහා මෙම පුස්තකාල ප්‍රමාණය කිහිප ගුණයකින් වැඩි කළ යුතුවනවා මෙන්ම පුස්තකාල හා තොරතුරු සේවාව ව්‍යාප්ත කරලීම සඳහා වූ වෙනත් මාර්ග පිළිබඳවද අවධානය යොමු කළ යුතුවේ. ඒ අනුව ඉදිරි වසර 5 තුළ දිවයිනේ මහජන පුස්තකාල ප්‍රමාණය අවම වශයෙන් 3000 දක්වා වැඩි කිරීමට පියවර ගැනීම වැදගත් වේ. එසේම මුල් කාලයේ තිබූ **ප්‍රජාමණ්ඩල පුස්තකාල ක්‍රමය, කියවීම් ශාලා** වැනි දෑ නැවත නව මුහුණුවරකින් හඳුන්වා දීම සහ **ජංගම පුස්තකාල සේවා** පුළුල් ලෙස යොදා ගැනීම ද අත්‍යවශ්‍ය වේ. නව තාක්ෂණය භාවිත කිරීම හා අන්තර් ජාලය තුළින් තොරතුරු සෙවීම පමණක්ම වුවද පුස්තකාල සේවා ලෙස සැලකෙන බැවින් අද විදුලි සන්දේශ පහසුකම් ඇති බොහෝ තැන්වල පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමේ හැකියාව ලැබී ඇත. මහජන පුස්තකාල හා තොරතුරු සේවාවක මූලික අරමුණ සමාජයේ විවිධ

අංශවල අය සඳහා අවශ්‍ය තොරතුරු සපයාදීම බැවින් එම අවශ්‍යතාව සපුරාලීමේ නව මං සෙවීම වැදගත්වේ. පුස්තකාල හා තොරතුරු සේවා සැපයීම සඳහා සම්ප්‍රදායානුකූලව මෙන් විශාල ගොඩනැගිලි හා ඉඩ පහසුකම් සහිත ස්ථාන තව දුරටත් අවශ්‍ය නොවන අතර කුඩා ඉඩ ප්‍රමාණයක ඇති අන්තර්ජාලයට සම්බන්ධ වූ පරිගණකයක් මගින් ලංකාවේ ඇති විශාලතම පුස්තකාලයේ තැන්පත් කර ඇති තොරතුරු මෙන් සිය දහස් ගුණයක තොරතුරු සහ දැනුම ලබා දිය හැකිවේ.

## 7.9 මහජන පුස්තකාල ක්ෂේත්‍රයේ යල් පැන ගිය නීති රීති ඉවත් කිරීම

පළාත් පාලන පුස්තකාල ක්ෂේත්‍රයේ ඇතැම් නීති රීති පුස්තකාල සේවාවේ වර්ධනයට නුසුදුසු ලෙස බලපා ඇත. පුස්තකාලවල පොත් පත් දැනට ප්‍රාග්ධන භාණ්ඩ ලෙස සැලකෙන අතර ඒවා නැතිවීම හා අස්ථානගත වීම ප්‍රාග්ධන භාණ්ඩයක් නැතිවීම හා සමාන ලෙස සැලකේ. මේ හේතුවෙන් පුස්තකාලයාධිපතිවරුද පොත් පත් පාඨක පරිහරණයට යෙදවීමට වඩා ඒවා අල්මාරි තුළ යතුරුලා තබා ගැනීමට උනන්දු වේ. පොත් පත් තෝරා ගැනීමේදී ද පුස්තකාල කමිටුව සහ පුස්තකාලයාධිපතිවරයා එම කාර්යය කරනු වෙනුවට පළාත් පාලන ආයතනවල වෙනත් නිලධාරීන් මැදිහත් වීමක් පෙනේ. මෙම නිලධාරීන් ඇතැම් පෞද්ගලික පොත් වෙළඳුන් සමඟ සම්බන්ධ වී සිදු කරනු ලබන අයථා කටයුතු පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රසිද්ධ රහසක් වී ඇත. මහජන පුස්තකාල ක්ෂේත්‍රයේ දැනට මුල් බැස ගෙන ඇති සංවර්ධන විරෝධී ආකල්ප හා මුහුණුවර ඉවත්කොට මහජන පුස්තකාල සේවාව සරල හා පැහැදිලි නීතිරීති මගින් පාලනය වන ආදර්ශමත් සේවාවක් කළ යුතුවේ.

## 7.10 පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට සහ මෙම ක්ෂේත්‍රයේ ප්‍රධාන නිලධාරීන්ට නව තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනීමක් ලබාදීම

නව තොරතුරු තාක්ෂණයත්, එමගින් ජාතික සංවර්ධනය සඳහා ලබා ගත හැකි අසීමිත සහායයත් සලකා බලා පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා මෙම ක්ෂේත්‍රයේ ප්‍රධාන නිලධාරීන් නව තොරතුරු තාක්ෂණය පිළිබඳ නිරතුරුවම දැනුවත් කරලීමේ ව්‍යාපෘතියක් දියත් කිරීම නිර්දේශ කරමු. අමෙරිකා එක්සත් ජනපද රජය IBM අයතනය සමඟ සම්බන්ධ වී එහි මධ්‍යම රජයේ නිලධාරීන් සඳහා මෙබඳු ව්‍යාපෘතියක් දැනට දියත් කර ඇත.

## 7.11 පළාත් පාලන පුස්තකාල හා තොරතුරු සේවාව පිළිබඳවත්. විශේෂයෙන්ම එයට නව තාක්ෂණය යොදා ගැනීම පිළිබඳවත් උපදෙස් දීම සඳහා විශේෂ කමිටුවක් පත් කරලීම

